නිපුණතාව 12 :තාක්ෂණික දියුණුව පාරිසරික සමතුලිතතාව කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 12.3 : මානව ක්‍රියාකාරකම් නිසා වායු ගෝලයේ සිදු වන වෙනස් වීම් විමර්ශනය කරයි.

ඕසෝන් වායුව හා ඕසෝන් ස්ථරය හා CFC වායුව සම්බන්ධ පහත වරණ සලකා බලා ඒවා හරිනම් ✓ද වැරදිනම් × ලකුණද යොදන්න.

a) ඕසෝන් ස්ථරය අපවර්ති ගෝලයේ පිහිටයි. ( )
b) ඕසෝන් ස්ථරය ඉතා ඝන ස්ථරයකි. ( )
c) ඕසෝන් ස්ථරය පොලොව මට්ටමේ සිට 25 km පමණ දුරින් පිහිටයි. ( )
d) ඕසෝන් ස්ථරය UVA කිරණ අවශෝෂණය කරයි. ( )
e) ඕසෝන් වායුව පරමාණු තුනකින් සමන්විත වායුවකි. ( )
f) ඕසෝන් වායුව අධික ප්‍රතික්‍රියාශීලි හා ඉතා අස්ථායි වායුවකි. ( )
g) වායුගෝලයේ ඕසෝන් ඉතා සුලභ වායුවකි. ( )
h) ඕසෝන් විචාදක ගුණ ඇති අප්‍රසන්න ගන්ධයකින් යුත් වායුවකි. ( )
i) ඕසෝන් වියන, ඕසෝන් වලින් පමණක් සමන්විත වූ විශේෂිත ප්‍රදේශයකි. ( )
j) ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් (CFC) අණු ඕසෝන් අණු සමග සෘජුවම ප්‍රතික්‍රියා කර ඕසෝන් වියනට හානි කරයි. ( )